**ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ මාධ්‍ය නිවේදනයයි.**

2017 මැයි 30.

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත බලාත්මක වූ 2017 පෙබරවාරි 03 දින සිට මේ දක්වා ගත වූ මාස තුනකට මදක් වැඩි වූ කාල පරිච්ඡේදය තුළ පොදු අධිකාරීන් සහ සාමාන්‍ය පුරවැසියන් සුවිශේෂී ප්‍රමාණයක් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙන් නිරන්තරයෙන් කරනු ලබන විවිධාකාර විමසීම් පිළිබඳ මෙම කොමිෂන් සභාව මහත්සේ සතුටට පත්වන අතර, ඒ සම්බන්ධයෙන් පොදු මහජනතාවත් සියලු පොදු අධිකාරීන්ටත් සිය කෘතඥතාව පළකර සිටී. විශේෂයෙන්, දිනෙන් දින ඉහළ යමින් පවතින විමසීම් වලින් පෙනී යන්නේ තොරතුරු දැනගැනීමේ පනත මගින් සහතික කර තිබෙන ඔවුන් සතු අයිතිය බුක්ති විඳීමට ඔවුන් දක්වන උනන්දුව පමණක් නොව, ඒ සම්බන්ධයෙන් ඔවුන්ගෙන් ලැබෙන සහයෝගයේ පරිමාණයයි. අනෙක් අතින් දැනටමත් ඇතැම් පොදු අධිකාරීන් විසින් හුදෙක් සිය කැමැත්තෙන්ම පනතේ ප්‍රගාමී ලෙස හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සමග අනුගත වනු දැකීම අපව මහත්සේ දිරිගන්වන සුලුය.

තොරතුරු පනතේ විධිවිධාන යටතේ පිහිටුවා ඇති ස්වාධීන හා ව්‍යවස්ථාපිත අභියාචන ආයතනයක් වන මෙම කොමිෂන් සභාව විසින් මෑතදී අසා නිම කරනු ලැබූ අභියාචන දෙකක් ගැන මෙහිලා සඳහන් කරනු වටියි. මෙම අවස්ථා දෙකේදීම අදාළ සියලු පාර්ශවයන්ගේ තෘප්තියට හේතුවන පරිදි අභියාචන කරුවන් දෙදෙනාටම පනත යටතේ ඉල්ලා තිබූ තොරතුරු, කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට නියම කරනු ලැබ තිබූ අදාළ පොදු අධිකාරීන්ගෙන් ලැබුණි. මේ වන විට තවත් අභියාචන ගණනාවක් ද කොමිෂන් සභාව ඉදිරියේ විභාග වෙමින් පවතී.

මේ අතර කොමිෂන් සභාව වෙත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පටිපාටිමය හා මූලික අංග පිළිබඳව මඟ පෙන්වීම් ඉල්ලා පොදු අධිකාරීන් වෙතින් ඉල්ලීම් රාශියක් ලැබී ඇතිවා පමණක් නොව, තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලැබීම නිසා සිදුවී ඇති අසාධාරණයන් පිළිබඳ දන්වමින් පුරවැසියන්ගෙන් (පොදු නිලධාරීන් ද ඇතුලුව) ද ලිපි ලැබෙමින් පවතියි. ගතවූ මාසවලදී එවැනි ලිපි තුන්සියයකට ආසන්න ප්‍රමාණයක් ලැබී තිබේ. මේ සියල්ලෙන් ගම්‍ය වන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම භාවිතා කිරීමට මහජනයා අතර පවත්නා පෙළඹීම කොමිෂන් සභාව දිරිමත් කරන්නකි. ලැබෙන ඉල්ලීම් වලට ප්‍රතිචාර දක්වනු ලබන්නේ දැඩි සේම, එක් එක් ලිපිය තනි තනිව සලකා බලමින් සහ ඒවා ලැබෙන අනුපිළිවෙළ අනුව ය. කෙසේ නමුත්, කොමිෂන් සභාව තවමත් ක්‍රියාත්මක වන්නේ තාවකාලික පරිශ්‍රයක සිට ඉතා සීමිත කාර්ය මණ්ඩලයක් සමග වන හෙයින්, කොමිෂන් සභාව විසින් මෙකී ලිපි වලට හැකිතාක් උපරිම වේගයකින් ප්‍රතිචාර දක්වමින් සිටියි.

විශේෂයෙන්ම පොදු අධිකාරිවල සිටින තොරතුරු නිලධාරීන් විසින් උපදෙස් පතමින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිරීක්ෂණය වන්නේ ඒවා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(5) වගන්තිය යටතේ 'තොරතුරක් වෙත ප්‍රවේශ වීම හා සම්බන්ධ' කාර්යපටිපාටික ගැටලුවලට සම්බන්ධව සළකා බලනු ලබනු ඇති බවයි. කෙසේ නමුත්, පනතේ යෙදීම සම්බන්ධ වාස්තවික/වැදගත් කාරණයක් පිළිබඳ උපදෙස් ලබා දීමට කොමිෂන් සභාවට කණගාටුදායක ලෙස හැකියාවක් නොමැත්තේ, එම කාරණයම විධිමත් ආකාරයෙන් අභියාචනයක් වශයෙන් කොමිෂන් සභාව වෙත පැමිණි අවස්ථාවකදී එය විභාගයට ගැනීම මගින් අගතියත් සිදු විය හැකි නිසා ය. මේ සම්බන්ධයෙන්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ මූලික අරමුණ වන්නේ පොදු යහපත නමැති අතික්‍රමණ මූලධර්මයට නැවත වරක් යටත් විය යුතු පටු ව්‍යාතිරේඛවලට විෂය වෙමින්, තොරතුරු උපරිම ලෙස හෙළිදරව් කිරීම බව ද අවධාරණය කිරීමට කොමිෂන් සභාව බලාපොරොත්තු වේ.

පනත විසින් නියම කරනු ලැබ ඇති පරිදි තවමත් තොරතුරු නිලධාරීන් හා නම්කළ නිලධාරීන් පත්කිරීමේ අනිවාර්ය ව්‍යවස්ථාපිත කාර්යය ඉටුකිරීමට බැඳී සිටින, එනමුත් තවමත් පනත සමග අනුකූල වී නැති

පොදු අධිකාරීන්ට, තොරතුරු නිලධාරීන් සහ නම් කළ නිලධාරීන් පත්කරන ලෙසත්" ඒවා ප්‍රසිද්ධ කරන ලෙසත් කොමිෂන් සභාව ඉල්ලා සිටියි.

එසේම ඉදිරියේදී එළිදැක්වීමට නියමිත, ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාවේ නිල ලාංඡනය මෙන්ම දැනට මූලික මට්ටමේ පවතින සහ තවදුරටත් යාවත්කාලීන කෙරෙමින් පවතින නිල වෙබ් අඩවිය පිළිබඳව කොමිෂන් සභාව නිවේදනය කරන්නේ මහත් සතුටිනි. මෙම වෙබ් අඩවිය 2017 - 2019 කාලය සඳහා කොමිෂන් සභාවේ ක්‍රමෝපායික සැලැස්මට (SIP) සමග සම්බන්ධ වන අතර, තීන්දු කරන ලද අභියාචන හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමට අදාළ ලියකියවිලිද මෙම වෙබ් අඩවියට ඇතුළත් වනු ඇත. එසේම වැදගත් කරුණක් වන්නේ, පනතේ 42 වගන්තිය අනුව (10 වගන්තිය යටතේ) පරීක්ෂණ රීති සහ වාර්තා ආකෘති මෙන්ම පනතේ 8 හා 9 වගන්ති යටතේ පොදු අධිකාරීන් විසින් කළ යුතු ප්‍රගාමී හෙළිදරව් කිරීම්වලට අදාළ මාර්ගෝපදේශනයන් ද වැදගත් මෙහි ඇතුළත් වනු ඇත. මෙම කෙටුම්පත් රීති හා මාර්ගෝපදේශන අවසානාත්මක කර ගැසට් කිරීමට පෙර ප්‍රතිපෝෂණය සඳහා මහජන විෂය පථයට යොමු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ වගවීමේ හා විවෘතභාවයේ සංස්කෘතියක් මුදුන්පත්කර ගැනීමෙහිලා, තවමත් විකාශනය වෙමින් පවතින තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ක්‍රියාවලිය තුළ මහජන සහභාගිත්වය අත්‍යාවශ්‍යය සහ අත්හළ නොහැක යන කොමිෂන් සභාවේ තිරසර විශ්වාසයේ දැක්මෙන් යුතුව මේ කාරණය සම්බන්ධයෙන් මහජන ප්‍රතිචාරවලට ආරාධනා කෙරේ. පනත යටතේ අවශ්‍ය කරන රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණු කටයුතු පහසුකරණය කඩිනම්ව ආරම්භ කිරීමට ද කොමිෂන් සභාව අපේක්ෂා කරයි.


තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සම්බන්ධතා විස්තර:

ලිපිනය : 2-203-204, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,

බෞද්ධාලෝක මාවත, කොළඹ -07.

දුරකථනː 011 2691625